පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය} මව්බස

සතිය- 11

ශ්‍රේණිය:- 3

සැකසුම:- කුසුම් රුබසිංහ මිය 3 ශ්‍රේණිය බාර ආචාර්ය ර/ඇඹි/ ජඳුර මහා විද්‍යාලය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

- **වාරිකාවක විස්තර අඩංගු පහත වාර්තා කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න?**

**මා ඉගෙනුම ලබන්නේ මද්දුම බණ්ඩාර මහ විදුහලේ ප්‍රාථමික අංශයේ යි .අප විදුහලේ වාර්ෂික අධ්‍යාපන වාරිකාව සඳහා මම ද සහභාගී වුනෙමි .නියමිත දින උදැසන මා පාසලට යන විට වාරිකාව යාම සඳහා සිසුහු පාසලට පැමිණ සිටියහ. අපගේ <u>විදුහල්පතිතුමා</u> ද ,ප්‍රාථමික අංශයේ <u>විදුහල්පතිතුමිය</u> ඇතුළු ගුරු මහත්ම - මහත්මීහු කිහිප දෙනෙක් ද වාරිකාවට සහභාගී වූහ.**

**දිවා ආහාරයෙන් පසු කෞතුකාගාරය නැරඹූ අපි සත්තු වත්ත බැලීමට ගියෙමු. සතුන් වත්තට ඇතුළුවීමේ දොරටුවෙන් <u>ශිෂ්‍යයා</u> හා <u>ශිෂ්‍යාව</u> බැගින් ඇතුළු කරන ලද්දදේ එහි සේවය කරන නිළධාරී මහත්මයකු විසිනි.**

**අප සත්තු වත්ත නැරඹීම ආරම්භ කළේ මින් මැදුරෙනි.ඉන් පසු විවිධ සතුන් නරඹමින් ඉදිරියට ගිය අපි වන සතුන් සිටින ස්ථාන කරා ගියෙමු.එහි එක් ස්ථානයක <u>මුවා</u> අසලින් <u>මුව දෙන</u> හා පැටවුන් දෙදෙනෙකු සිටිනු අපි දුටුවෙමු.**

**<u>සිංහයා</u> සිටි ස්ථානය අසලට යන විට බිය ඇති වුවත් තිබූ බිය පහව ගියේ ගුරු මහත්ම -මහත්මීන් ද අප අසලින් සිටි බැවිනි. එම ස්ථානයේ <u>සිංහ ධේනුව</u> ද ඔබ මොබ ඇවිදිමින් සිටිනු දැක ගත හැකි විය.**

**කෙටි විවේකයක් ලැබුණි. එම විවේකයේ දී මගේ <u>මිතුරා</u> සහ <u>මිතුරිය</u> සමඟ මම ද ආපන ශාලාව දෙසට පියමං කළෙමි.**

**<u>ඉහත ඡේදය කියවා ස්ත්‍රී ලිංග -පුරුෂ ලිංග පද වගු ගත කරන්න</u>**

| ස්ත්‍රී ලිංග පද | පුරුෂ ලිංග පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |